# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2054/15 – 2018 ජනවාරි 15 වැනි සඳුදා – 2018.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 12 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/103.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ජේ/ඩීඑස්/2/9/4/09-2016.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, යාපනය.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජේ/74 යාපනය නගරය නැගෙනහිර, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වුන්ඩිකුලි (කොට්ඨාස අංක 04 යාපනය මහා නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක වයිඒ/ජේඑෆ්එෆ්/2016/215 හා 2016.08.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0024ක් පමණ වන තේවරීර් කුලම් නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තේවරීර් කුලම් – ප්‍රමාණය: හෙක්. 0.0024ක් පමණ**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: යාපනය මහ නගර සභාව සතු තේවරීර් කුලම් දේපළ.

02 - 22